බුලූගුල් මරාම්

[සිංහල – Sinhala – سنهالي]

අෂ් ෂෙයික් ඉබ්න් හජර් අල් අෂ්කලානි

සිංහල පරිවර්තනය

මව්ලවි මාහිර් රම්ඩීන්

2014 - 1435

IslamHouse.com

بلوغ المرام

« باللغة السنهالية »

ابن حجر العسقلاني

ترجمة: ماهر رمدين

2014 - 1435

IslamHouse.com

අපරමිත දයාන්විත අසම සම කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙනි.

بلوغ المرام

බුලූගුල් මරාම්

නබි චරිතයෙහි ඔබ සවන් දුන් දෑ

كتاب الطهارة - باب المياه

1- පරිච්ඡේදය පිරිසිදුකම පිළිබඳ පොත - ජලය පිළිබඳ පාඩම

(١) - عَنْ أَبِي هُرَيْرَةَ رَضِيَ اللهُ عَنْهُ قَالَ : قَالَ رَسُولُ اللهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ ، فِي الْبَحْرِ "**هُوَ الطَّهُورُ مَاؤُهُ ، الْحِلُّ مَيْتَتُهُ**" أَخْرَجَهُ الْأَرْبَعَةُ ، وَابْنُ أَبِي شِيْبَةَ، وَاللَّفْظُ لَهُ ، وَصَحَّحَهُ ابْنُ خُزَيْمَةَ وَالتِّرْمِذِيُّ ، [وَرَوَاهُ مَالِكٌ وَالشَّافِعِيُّ وَأَحْمَدُ] .

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) සාගරය සම්බන්ධයෙන් පවසා සිටිය දී එහි ජලය පිරිසිදුය. එහි (ඇති ජීවීන් අතුරින්) මිය ගිය දෑ ද ආහාරයට අනුමතය යැයි පැවසූ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

(මූලශ්‍රය: අබූ දාවූද්, නසාඊ, තිර්මිදි, ඉබ්නු මාජා, ඉබ්නු අබී ෂෙයිබා, ඉබ්නු කුසෙයිමා, මාලික්, ෂාෆි හා අහ්මද්.

මෙහි සඳහන්ව ඇත්තේ ඉබ්නු අබී ෂෙයිබා වාර්තා කළ වදන් පෙළයි. ඉබ්නු කුසෙයිමා හා තිර්මිදී මෙය පූර්ව සාධක සහිත හදීසයක් බව සඳහන් කරයි.)

සටහන: එහි ජලය පිරිසිදුයි යන්නෙන් අදහස් කරනුයේ, මුහුදු ජලය බීමට ගත නොහැකි නමුත් එයින් වුළු ධෝවනය කිරීමටත් ස්නානය කිරීමටත් අනුමැතිය ඇති බවය.

(٢) - وَعَنْ أَبِي سَعِيدٍ الْخُدْرِيِّ رَضِيَ اللهُ عَنْهُ قَالَ قَالَ رَسُولُ اللهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ "**إِنَّ الْمَاءَ طَهُورٌ لَا يُنَجِّسُهُ شَيْءٌ**" أَخْرَجَهُ الثَّلَاثَةُ وَصَحَّحَهُ أَحْمَدُ .

සැබැවින්ම ජලය පිරිසිදුය. එය කිසිවක් අපිරිසිදු නොකරනු ඇතැයි අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) පැවසූ බව අබූ සඊද් අල්-කුද්රි (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

(මූලාශ්‍රය: අබූ දාවූද්, නසාඊ, තිර්මිදි. ඉමාම් අහ්මද් මෙය පූර්ව සාධක සහිත හදීසයක් බව සඳන් කරයි.)

සටහන: ජලය පිරිසිදුයි යනුවෙන් අදහස් කරනුයේ අහසින් පහළ වන මිහිතලයෙන් පිටාර ගලන වර්ණයේ හෝ සුවයේ හෝ ගඳෙ හි හෝ කිසිදු වෙනසක් නොවූ සියලු වර්ගයේ ජලයයි. නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගෙන් පුද්ගලයෙකු පැමිණ පොළොව යටින් ගලා යන ගංගාවක් හේතුවෙන් ජලය නිතර වෙනස් වෙමින් පැවතුණු මදීනාවෙ හි පිහිටි බිළාආ නම් ළිඳ පිළිබඳ විමසා සිටිය දී එතුමාණෝ පිළිතුරු වශයෙන් මෙම හදීසය ප්‍රකාශ කළහ.

(٣) - وَعَنْ أَبِي أُمَامَةَ الْبَاهِلِيِّ رَضِيَ اللهُ عَنْهُ قَالَ : قَالَ رَسُولُ اللهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ: "**إِنَّ الْمَاءَ لَا يُنَجِّسُهُ شَيْءٌ ، إِلَّا مَا غَلَبَ عَلَى رِيحِهِ وَطَعْمِهِ وَلَوْنِهِ**" أَخْرَجَهُ ابْنُ مَاجَهْ ، وَضَعَّفَهُ أَبُو حَاتِمٍ.

සැබැවින්ම ජලය එහි දුහඳ සුවය හා වර්ණය ඉක්මවා ගිය දෙයකින් හැර වෙන කිසිවක් එය අපිරිසිදු නොකරයි. යැයි අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් පැවසූ බව අබූ උමාමා අල්-බාහිලී (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් වාර්තා කරන ලදී.

(මූලාශ්‍රය: ඉබ්නු මාජා, අබූ හාතිම් මෙය දුර්වල හදීසයක් බව සඳහන් කරයි.)

(٤) – وَلِلْبَيْهَقِيِّ "**الْمَاءُ طَهُورٌ إِلَّا إِنْ تَغَيَّرَ رِيحُهُ ، أَوْ طَعْمُهُ ، أَوْ لَوْنُهُ، بِنَجَاسَةٍ تَحْدُثُ فِيهِ**"

එහි සිදු වුණු අපවිත්‍රයකින් එහි දුහඳ හෝ එහි සුවය හෝ වර්ණය වෙනස් නොවූයේ නම් එම ජලය පිරිසිදු යැයි බයිහකී හි සඳහන් වී ඇත.

(٥) - وَعَنْ عَبْدِ اللهِ بْنِ عُمَرَ رَضِيَ اللهُ عَنْهُمَا قَالَ : قَالَ رَسُولُ اللهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ : "**إِذَا كَانَ الْمَاءُ قُلَّتَيْنِ لَمْ يَحْمِلْ الْخَبَثَ**" وَفِي لَفْظٍ "**لَمْ يَنْجُسْ**" أَخْرَجَهُ الْأَرْبَعَةُ ، وَصَحَّحَهُ ابْنُ خُزَيْمَةَ وَالْحَاكِمُ وَابْنُ حِبَّانَ .

ජලය කුල්ලතෙයින් (ප්‍රමාණයෙන්) වී නම් එය අපිරිසිදු දැ නොඋසුලයි. -තවත් ප්‍රකාශයක- එය අපිරිසිදු නොවෙයි යැයි අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමා ප්‍රකාශ කළ බව අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හුමා) විසින් වාර්තා කරන ලදී.

(මූලාශ්‍රය: අබූ දාවූද්, නසාර්, ඉබ්නු මාජා, තිර්මිදි. ඉබ්නු කුසෙයිමා, අල්-හාකිම්, ඉබ්නු හිබ්බාන් යන අය මෙය පූර්ව සාධක හදීසයක් යැයි සඳහන් කොට ඇත.)

සටහන: කුල්ලත් යනු එකල අරාබි වරුන් භාවිත කළ මිනුම් ඒකකයකි. එය එළු හමකින් මසා නිම කළ මල්ලකි. එවැනි මලු දෙකක් පුරවන ලද ජල ධාරිතාව කුල්ලතෙයින් යනුවෙන් හැඳින් වේ.

(٦) - وَعَنْ أَبِي هُرَيْرَةَ رَضِيَ اللهُ عَنْهُ قَالَ : قَالَ رَسُولُ اللهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ "**لَا يَغْتَسِلْ أَحَدُكُمْ فِي الْمَاءِ الدَّائِمِ وَهُوَ جُنُبٌ**" أَخْرَجَهُ مُسْلِمٌ.

තමන්ට ස්නානය අනිවාර්යය වූ තත්ත්වයේ ඔබ අතුරින් කිසිවෙකු රැඳී පවතින ජලයේ ස්නානය නොකළ යුතුයි යනුවෙන් අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. (මූලාශ්‍රය: මුස්ලිම්)

සටහන: රැඳී පවතින ජලය යනු ජලය රැස් කොට සංරක්ෂණය කරන ජල තටාක, සත්වයින්ගේ පානය සඳහා තනා ඇති කුඩා ටැංකි, වතුර වළ වල් වැනි දෑ උදාහරණ වශයෙන් සඳහන් කළ හැක.

(٧) - وَلِلْبُخَارِيِّ "**لَا يَبُولَنَّ أَحَدُكُمْ فِي الْمَاءِ الدَّائِمِ الَّذِي لَا يَجْرِي، ثُمَّ يَغْتَسِلُ فِيهِ**"

ඔබ අතුරින් කිසිවෙකු නොගලා රැඳී පවතින ජලයෙ හි මූත්‍රා කර පසුව ඔහු එහි ස්නානය නොකළ යුතු යැයි බුහාරි හී සඳහන්ව ඇත.

(٨) - وَلِمُسْلِمٍ مِنْهُ ، وَلِأَبِي دَاوُد : "**وَلَا يَغْتَسِلُ فِيهِ مِنْ الْجَنَابَةِ**"

ජනාබත් හේතුවෙන් -ස්නානය අනිවාර්යය වූ තත්ත්වයේ - එහි (රැඳී පවතින ජලයෙහි) ඔහු ස්නානය නොකළ යුතු යැයි මුස්ලිම් හි ද අබූ දාවූද් හි ද සඳහන් ව ඇත.

(٩) - وَعَنْ رَجُلٍ صَحِبَ النَّبِيَّ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ قَالَ : "نَهَى رَسُولُ اللهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ أَنْ تَغْتَسِلَ الْمَرْأَةُ بِفَضْلِ الرَّجُلِ ، أَوْ الرَّجُلُ بِفَضْلِ الْمَرْأَةِ ، وَلْيَغْتَرِفَا جَمِيعًا" أَخْرَجَهُ أَبُو دَاوُد وَالنَّسَائِيُّ وَإِسْنَادُهُ صَحِيحٌ .

පිරිමියා ස්නානය කොට ඉතිරි කළ ජලයෙන් කාන්තාව ස්නානය කිරීමත් කාන්තාව ස්නානය කොට ඉතිරි කළ ජලයෙන් පිරිමියා ස්නානය කිරීමත් අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් තහනම් කළහ. එමෙන්ම (අවශ්‍යතාවක් ඇති වූ විටක) දෙදෙනාම ඉන් ඇද ස්නානය කළ යුතු යැයි ප්‍රකාශ කළ බව සහාබි වරයෙකු විසින් වාර්තා කරන ලදී.

(මූලාශ්‍රය: අබූ දාවූද්, නසාඊ, මෙම හදීස් වාර්තා සම්බන්ධතාව පූර්ව සාධක සහිත යැයි සඳහන්ව ඇත.)

(١٠) - وَعَنْ ابْنِ عَبَّاسٍ رَضِيَ اللهُ عَنْهُمَا : "أَنَّ النَّبِيَّ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ كَانَ يَغْتَسِلُ بِفَضْلِ مَيْمُونَةَ رَضِيَ اللهُ عَنْهَا" . أَخْرَجَهُ مُسْلِمٌ .

(උම්මුල් මුඃමිනීන්) මයිමූනා (රළියල්ලාහු අන්හා) තුමිය ස්නානය කර, ඉතිරි වී ජලයෙන් ඇත්තෙන්ම නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් ස්නානය කරන්නෙකු වූහ යැයි ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් වාර්තා කරන ලදී.

(මූලාශ්‍රය: මුස්ලිම්)

(١١) - وَلِأَصْحَابِ السُّنَنِ : اغْتَسَلَ بَعْضُ أَزْوَاجِ النَّبِيِّ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ فِي جَفْنَةٍ ، فَجَاءَ يَغْتَسِلُ مِنْهَا ، فَقَالَتْ : إِنِّي كُنْت جُنُبًا، فَقَالَ : "**إِنَّ الْمَاءَ لَا يَجْنُبُ**" وَصَحَّحَهُ التِّرْمِذِيُّ ، وَابْنُ خُزَيْمَةَ .

නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගේ භාර්යාවන්ගෙන් කෙනෙකු විශාල භාජනයක ස්නානය කරමින් සිටියාය. එතුමාණන් ද එයින් ස්නානය කිරීමට පැමිණියහ. එවිට ඇය සැබැවින්ම මම ජුනුබ් -ස්නානය අනිවාර්යය වූ- තත්ත්වයේ පසුවෙමි යැයි පැවසුවාය. එවිට එතුමා සැබැවින්ම ජලය කිසිවිටක අපිරිසිදු නොවන්නේය යැයි පැවසූහ.

(මූලාශ්‍රය: තිර්මිදි, ඉබ්නු මාජා, අබූ දාවූද්, නසාඊ. තිර්මිදි හා ඉබ්නු හුසෙයිමා යන අය මෙය පූර්ව සාධක සහිත හදීසයක් යැයි සඳහන් කර ඇත.)

(١٢) - وَعَنْ أَبِي هُرَيْرَةَ رَضِيَ اللهُ عَنْهُ قَالَ : قَالَ رَسُولُ اللهِ صَلَّى اللَّهُ عَلَيْهِ وَسَلَّمَ: "**طُهُورُ إِنَاءِ أَحَدِكُمْ إِذَا وَلَغَ فِيهِ الْكَلْبُ أَنْ يَغْسِلَهُ سَبْعَ مَرَّاتٍ ، أُولَاهُنَّ بِالتُّرَابِ**" أَخْرَجَهُ مُسْلِمٌ . وَفِي لَفْظٍ لَهُ " **فَلْيُرِقْهُ** " ، وَلِلتِّرْمِذِيِّ " **أُخْرَاهُنَّ ، أَوْ أُولَاهُنَّ** " .

ඔබ කිසිවෙකුගේ භාජනයක් සුනඛයා ලෙව කෑ විට එය පිරිසිදු වනුයේ සත් වරක් සේදීමෙනි. ඉන් ප්‍රථම වාරය පසින් විය යුතු යැයි අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරා

(රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් වාර්තා කරන ලදී.
(මූලාශ්‍රය: මුස්ලිම්)

සටහන: මුස්ලිම් හි සඳහන් තවත් වදන එය හළා දමන්නැයි සඳහන් වී ඇත. තිර්මිදී හි සඳහන් වදනක ප්‍රථම වාරයේ හෝ අවසන් වාරයේ පසින් සෝදන්නැයි සඳහන් වී ඇත.

(١٣) - وَعَنْ أَبِي قَتَادَةَ رَضِيَ اللهُ عَنْهُ، أَنَّ رَسُولَ اللَّهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ قَالَ - فِي الْهِرَّةِ - : "**إِنَّهَا لَيْسَتْ بِنَجَسٍ، إِنَّمَا هِيَ مِنْ الطَّوَّافِينَ عَلَيْكُمْ**" أَخْرَجَهُ الْأَرْبَعَةُ ، وَصَحَّحَهُ التِّرْمِذِيُّ وَابْنُ خُزَيْمَةَ .

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) බළලා පිළිබඳව ප්‍රකාශ කිරීමේ දී, සැබැවින්ම ඌ අපිරිසිදු නොවෙයි. ඌ නිතර ඔබ අවට ගැවසෙන්නන් අතුරිනි යැයි පැවසූ බවු අබූ කතාදා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

(මූලාශ්‍රය: අබූ දාවූද්, නසාඊ, තිර්මිදි හා ඉබ්නු මාජා. තිර්මිදි හා ඉබ්නු හුසෙයිමා මෙය පූර්ව සාධක සහිත හදීසයක් යැයි සඳහන් කර ඇත.)

(١٤) - وَعَنْ أَنَسِ بْنِ مَالِكٍ رَضِيَ اللهُ عَنْهُ ، قَالَ : "جَاءَ أَعْرَابِيٌّ فَبَالَ فِي طَائِفَةِ الْمَسْجِدِ ، فَزَجَرَهُ النَّاسُ ، فَنَهَاهُمْ النَّبِيُّ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ ، فَلَمَّا قَضَى بَوْلَهُ أَمَرَ النَّبِيُّ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ بِذَنُوبٍ مِنْ مَاءٍ ؛ فَأُهْرِيقَ عَلَيْهِ" مُتَّفَقٌ عَلَيْهِ .

ගැමි අරාබි ජාතිකයෙකු පැමිණ මස්ජිදයේ එක් පැත්තක මූත්‍රා කළේය. ජනයා ඔහුව එළවා හරින්නට තැත් කළහ. එවිට අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ඔවුන්ව වැළැක්වූහ. ඔහු මූත්‍රා කොට අවසන් වූ කල් හි ජල බඳුනක් ගෙන එන මෙන් නියෝග කොට පසුව ඒ මත එය වක්කරනු ලැබීය. යැයි අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරනු ලැබීය. (මූලාශ්‍රය බුහාරි හා මුස්ලිම්)

(١٥) - وَعَنْ ابْنِ عُمَرَ رَضِيَ اللهُ عَنْهُمَا قَالَ : قَالَ رَسُولُ اللهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ "**أُحِلَّتْ لَنَا مَيْتَتَانِ وَدَمَانِ. فَأَمَّا الْمَيْتَتَانِ : فَالْجَرَادُ وَالْحُوتُ ، وَأَمَّا الدَّمَانِ : فَالطِّحَالُ وَالْكَبِدُ**" أَخْرَجَهُ أَحْمَدُ ، وَابْنُ مَاجَهْ ، وَفِيهِ ضَعْفٌ .

මළ දෑ දෙවර්ගයක් හා රුධිර දෙවර්ගයක් අපට අනුමත කරන ලදී. මළ දෑ දෙවර්ගය නම්, ජරාද් නම් පළගැටි වර්ගයා හා මත්ස්‍යාය. රුධිර දෙවර්ගය නම් පීකුදු හා ඇලදිව යැයි අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් වාර්තා කරන ලදී. (මූලාශ්‍රය: අහ්මද්, ඉබ්නු මාජා)

මෙම හදීසයේ වාර්තා සම්බන්ධතාවේ දුර්වලතාවක් ඇති බව සඳහන් වේ.

(١٦) - وَعَنْ أَبِي هُرَيْرَةَ قَالَ : قَالَ رَسُولُ اللهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ: "**إِذَا وَقَعَ الذُّبَابُ فِي شَرَابِ أَحَدِكُمْ فَلْيَغْمِسْهُ ، ثُمَّ لِيَنْزِعْهُ فَإِنَّ فِي أَحَدِ**

جَنَاحَيْهِ دَاءً وَفِي الْآخَرِ شِفَاءً" أَخْرَجَهُ الْبُخَارِيُّ ، وَأَبُو دَاوُد. وَزَادَ "وَإِنَّهُ يَتَّقِي بِجَنَاحِهِ الَّذِي فِيهِ الدَّاءُ"

ඔබ කිසිවකුගේ පානයට මැස්සෙකු වැටුණු විට එය එහි ගිල්වා පසුව එය ඉවත් කරන්න. හේතුව සැබැවින්ම උගේ තටු දෙකින් එකක රෝගය ඇත. අනෙකෙහි නිවාරණය ඇතැයි අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

(මූලාශ්‍රය: බුහාරි, අබූ දාවූද්)

ඇත්තෙන්ම එය රෝග සහිත උගේ තටුවෙන් ආරක්ෂාව සලසාලයි යැයි ඉමාම් අබූ දාවූද් තුමා අමතරව සඳහන් කොට ඇත.

(١٧) - وَعَنْ أَبِي وَاقِدٍ اللَّيْثِيِّ رَضِيَ اللهُ عَنْهُ قَالَ : قَالَ النَّبِيُّ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ "**مَا قُطِعَ مِنْ الْبَهِيمَةِ - وَهِيَ حَيَّةٌ - فَهُوَ مَيِّتٌ**" أَخْرَجَهُ أَبُو دَاوُد وَالتِّرْمِذِيُّ، وَحَسَّنَهُ ، وَاللَّفْظُ لَهُ .

සිව්පාවුන් ජීවත් ව සිටිය දී උන්ගෙන් වෙන් කරනු ලැබූ කොටස් මළ දෑය යැයි නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමා ප්‍රකාශ කළ බව අබූ වාකිද් අල්-ලෛයිසිය් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

(මූලාශ්‍රය: අබූ දාවූද්, තිර්මිදි, ඉමාම් තිර්මිදි මෙම හදීසය හසන් නම් තත්ත්වයේ පසුවන්නක් බව සඳහන් කරයි. මෙහි සඳහන් වදන් පෙළ ද ඔහු සතු වූවකි.)